ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, නීතිපති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන

පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත්කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ - I (i)) අනුව වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ ආදායම රු.241,155,870ක් වුවත්, සංස්ථා අංශයේ ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව එය රු.242,326,345කි. ඒ අනුව රු.1,170,475ක වෙනසක් පැවතුණි.	පෙර වර්ෂවල හිඟයක් ලෙස සටහන් විය යුතු රු.1,170,475ක මුදල 2024 වර්ෂයේ හිඟ ආදායමක් ලෙස සටහන් වීම මෙම වෙනසට හේතු වී ඇති අතර, ලැබෙන සමහර චෙක්පත් සඳහා ඉන්වොයිස් අංක සටහන් වී නොමැති අවස්ථාවල දී මේ ආකාරයෙන් අදාළ වර්ෂය නිවැරදිව හඳුනාගැනීමට අසීරු වන අවස්ථා ඇති වේ. පසුව ඒවා නිවැරදි කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.	මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතු ය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - I (i)) පසුගිය වසරට අදාළ හිඟ ආදායම් ශේෂය රු.29,565,343ක් ලෙස දැක්වුව ද, සංස්ථා අංශයේ ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.29,775,118කි. ඒ අනුව රු.209,775ක වෙනසක් පැවතුණි.	සමහර අවස්ථාවල නීතිපති දෙපාර්තමේන්තුවෙන් අදාළ නඩු කටයුත්ත සඳහා ඉන්වොයිස්පත් යවා තිබුණ ද, අදාළ නඩු දිනයන්හී නීති කාර්යයන් සඳහා නිලධාරින්ට අධිකරණයේ පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවල දී ය. ඉන්වොයිස් සඳහා සංශෝධන ඉදිරිපත්වීම අදාළ වෙනසට හේතු වී ඇත.	මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතු ය.
(iii)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ අදායම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - I (i)) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ ආදායම් අයකර ගැනීම් ලෙස රු.19,659,253ක් දක්වා තිබුණ ද, සංස්ථා අංශයේ ලද තොරතුරු අනුව එම වටිනාකම රු.23,659,252ක් වූයෙන් රු.3,999,999ක වෙනසක් පැවතුණි.	මෙම වෙනසට හේතුව යවන ඉන්වොයිස්පත්‍රවලට අදාළව ලැබෙන චෙක්පත් සංශෝධන සහිතව ලැබීම සහ දෙපාර්තමේන්තුව විසින් යවනු ලබන ඉන්වොයිස් අංකය, අදාළ ආයතන වෙතින් ලැබෙන චෙක්පත තුළින් අදාළ වසර අනාවරණයකර ගැනීමට නොහැකිවීමයි.	මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතු ය.

(iv)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයට අනුව (ඒසීඒ - I (i)) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ ආදායම වර්ෂ අවසාන ශේෂය රු. 213,420,885 ක් වුවත්, සංස්ථා අංශයේ ඉදිරිපත් කළ තොරතුරු අනුව එම ශේෂය රු.212,283,550ක් වූයෙන් රු.1,137,335ක වෙනසක් පැවතුණි.	සංස්ථා අංශයේ සිදුකරනු ලබන සේවාවන් වෙනුවෙන් බිල්පත් සකස්කිරීම හා රැස්කරනු ලබන ආදායම්, ක්‍රමවත් පරිගණක දත්ත පද්ධතියක් හරහා සිදුනොකරන බැවින්, වරින් වර සිදුකරනු ලබන සංශෝධනයන් යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් වෙනස්කම් මතු වී ඇති අතර, කඩිනමින් ක්‍රමවත් පරිගණක දත්ත පද්ධතියක් සංස්ථා අංශය සඳහා ස්ථාපිත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතු ය.
(v)	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව වර්ෂය අවසානයට හිඟ ආදායමට රු.484,142,098ක් දක්වා තිබුණ ද, සංස්ථා අංශයේ ලද තොරතුරු අනුව එම ශේෂය රු.484,633,913ක් වීමෙන් රු.491,815ක වෙනසක් පැවතුණි.	සංස්ථා අංශයේ සිදුකරනු ලබන සේවාවන් වෙනුවෙන් බිල්පත් සකස්කිරීම හා රැස්කරනු ලබන ආදායම්, ක්‍රමවත් පරිගණක දත්ත පද්ධතියක් හරහා සිදුනොකරන බැවින්, වරින් වර සිදුකරනු ලබන සංශෝධනයන් යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් වෙනස්කම් මතු වී ඇති අතර, කඩිනමින් ක්‍රමවත් පරිගණක දත්ත පද්ධතියක් සංස්ථා අංශය සඳහා ස්ථාපිත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම පිළිබඳ තොරතුරු නිවැරදිව දැක්විය යුතු ය.

(ආ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 272 (3) ප්‍රකාරව සියලුම ගෙවූ වවුචර් ඒවාට අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොවැඩි කාලයක් ඉකුත්වීමට මත්තෙන් විගණකාධිපති වෙත මසක් පාසා යැවිය යුතු නමුත්, රු.967,229,350ක වටිනාකමකින් යුත් 2024 වර්ෂය සඳහා අදාළ වවුචර් 381ක් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.	විගණන විමසුමේ සඳහන් විගණනය වෙත ඉදිරිපත් නොකරන ලද වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.	අස්ථානගත වී තිබුණු වවුචර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 272(1) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, 1993 ජුලි 21 දිනැති අංක 320 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය පරිදි මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව මූල්‍යමය වටිනාකම අදාළ නිලධාරින්ට අධිභාරකර අයකරගත යුතු ය. ආයතන සංග්‍රහයේ

		XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය ක්‍රියාමාර්ගගත යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

	ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i)	1.6.2 (අ) (iv)	ඒසීඒ - I(i) හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ වාර්තාකරනු ලබන වසරට අදාළ හිඟ මුදල් හා 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ලේඛනය අනුව එම අගය අතර තිබූ වෙනස නිවැරදිකර නොතිබුණි.	1.6.1 (අ) (i)
(ii)	1.6.2 (අ) (v)	2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය හා හිඟ ආදායම් ලේඛනය අනුව එම ශේෂය අතර තිබූ වෙනස නිවැරදිකර නොතිබුණි.	1.6.1 (අ) (v)
(iii)	1.6.2 (අ) (vi)	ඒසීඒ - (i) ප්‍රකාශයේ පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් අයකර ගැනීම් හා 2023 ආදායම් අයකර ගත් උපලේඛනය අනුව එම ශේෂය අතර තිබූ වෙනස නිවැරදිකර නොතිබුණි.	1.6.1 (අ) (iii)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 128(2) (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරින් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2024 දෙසැම්බර්	හිඟ ආදායම රුපියල් මිලියන 3.0ට වැඩියෙන් පවතින ආයතනවල සභාපතිවරුන් කැඳවා ගෙවිය යුතු හිඟ මුදල් කඩිනම් කරන ලෙස දන්වා ඇත. එසේම අනෙකුත් ආයතන වෙත ගෙවීම් කරන ලෙස වරින් වර	හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

	31 දින වන විට දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ ආදායම ලෙස රු.484,633,913ක ශේෂයක් පැවති අතර, එම හිඟ ශේෂය තුළ වර්ෂ 10ට වැඩි ශේෂය රු.114,639,151ක් ද, වර්ෂ 7 – 9 දක්වා රු.28,840,247ක් ද, වර්ෂ 4 – 6ත් අතර, රු.42,072,857ක් ද, වර්ෂ 01 – 03 දක්වා රු.56,755,313ක් ද, වර්ෂ 1ට අඩු ශේෂය රු.242,326,345ක් ද, ඇතුළත්ව තිබුණි.	ලිඛිතව සිහි කැඳවීම් හා සියලුම ආයතනවල අදාළ නිලධාරින් වෙත දුරකතනය මඟින් ණයශේෂ පියවීමේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කිරීම, ගිණුම් වර්ෂය අවසන් වී පළමු කාර්තුව ඇතුළත සියලුම හිඟ ණය රු.10,000 වැඩි සියලුම ආයතන වෙත උපලේඛන සහිතව ණයශේෂයන් කඩිනමින් පියවන ලෙස දන්වා යැවීම හා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ණයශේෂ පිළිබඳ වෙනමම සාකච්ඡාවක් පවත්වා මෙම ණයශේෂ ගෙවීම සඳහා අදාළ ආයතන භාර අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කර තිබීම.	
(ආ)	මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව හිඟ මුදල් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු අතර, අප්‍රමාදව නීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. නීති මාර්ගයෙන් හෝ හිඟ මුදල් අයකර ගත නොහැකි නම් දීර්ඝකාලීන හිඟ මුදල් භාණ්ඩාගාරයේ එකඟතාව මත කපා හැරීම අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත්, 2005 සිට 2014 වර්ෂ දක්වා දීර්ඝකාලීනව ආයතන 164කින් රු.115,121,711ක ආදායමක් අයවීමට තිබුණි.	විගණන නිරීක්ෂණ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන්කර ගතිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඇ)	දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය තුළ 2003 සිට 2023 දක්වා වර්ෂවලට අදාළව රු.82,506,552ක හිඟ ආදායමක් එකතුකර ගෙන ඇති අතර, එය 2024 දෙසැම්බර් 31 දින දක්වා අයවීමට තිබූ ආදායම වූ රු.486,007,198ට සාපේක්ෂව සියයට 33.85ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.	හිඟ ආදායම් එකතුකර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව දන්වමි.	හිඟ ආදායම් කඩිනමින් එකතුකර ගත යුතු ය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට වූ හිඟ ආදායම් ශේෂ සම්බන්ධයෙන් විගණනයේදී සිදුකළ නියැදි ශේෂ තහවුරු කිරීම් අනුව, අදාළ ආයතනවලින් ලැබිය යුතු ශේෂ හා	අදාළ ආයතනවලට මුලින් ඉදිරිපත්කර ඇති බිල්පත් සඳහා පසුව සිදුකර ඇති සංශෝධන හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	ලැබිය යුතු හිඟ ආදායම් ශේෂ හා අදාළ ආයතනවල පවතින ශේෂ එකිනෙක ගැළපිය යුතු අතර නිවැරදි ද විය යුතු ය.

	ආයතනයට අයවිය යුතු ශේෂ අතර, රු.28,585,300ක වෙනසක් පැවතුණි.		
(ඉ)	2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස්කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයේ 04 ඡේදය පරිදි ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩිදියුණු කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ක්‍රමවත් පරිදි වාර්තා පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වන අතර, එහි සඳහන් (අ), (ආ) සහ (ඉ) පරිදි කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	ඉදිරියේ දී විගණන නිරීක්ෂණ පරිදි කටයුතු කිරීමට සටහන්කර ගතිමි.	චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය පිළිබඳව වැඩි අවධානයකින් යුතුව කටයුතු කළ යුතු ය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයන් 09ක් හා මූලධන වැය විෂයන් 02ක් සඳහා ප්‍රතිපාදන රු.142,000,000කින් රු.28,129,098ක් ඉතිරිව තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 09 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.	අයවැය චක්‍රලේඛ 01/2024 අනුව වියදම් පාලනය කිරීම හා මිලදීගැනීම් සීමාකිරීම නිසා අදාළ වැය විෂයන්හී ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වූ අතර, පුනරාවර්තන වැය විෂයන් 04ක් සඳහා බැරකම්වලට එළැඹ තිබුණි.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	සැලසුම් කරන ලද විදේශ නීති සම්මන්ත්‍රණයක් සඳහා සහභාගීත්වය අවලංගුවීම මත වෙන්කළ ප්‍රතිපාදනයෙන් රු.1,640,420ක් එනම්, සියයට 12ක් ඉතිරිව පැවතුණි. අදාළ සම්මන්ත්‍රණය සඳහා සහභාගීත්වය අවලංගුවීමට හේතු ඇතුළත් අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.	ලිඛිත සාක්ෂි විගණනයට අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු ය.

(ඇ)	ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා මුල් ප්‍රතිපාදනයෙන් සියයට 07 - 143ත් අතර, ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 මඟින් ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණි.	ඇස්තමේන්තු සකස්කිරීමේදී අපේක්ෂා කරන ලද වියදම්වලට අමතරව හදිසි අවශ්‍යතාවයන් මත ඇති වියදම් පියවාගැනීම සඳහා ඌණ ප්‍රතිපාදන සහිත වැය ශීර්ෂයන් වෙත මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකළ බව දන්වා සිටිමි. එයින් අපේක්ෂා කරන ලද්දේ අඛණ්ඩව සේවා කටයුතු පවත්වා ගෙන යාමයි.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ඈ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව විදුලිය, ජලය, දුරකථන සේවා සඳහා වන වියදම අවම කිරීම පිණිස උචිත පරිදි වියදම් පාලන ක්‍රමවේද යොදාගැනීමට කටයුතු කළ යුතු වුවත්, රු.4,000,000ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් විදුලිය හා ජලය සඳහා මාරුකර ගෙන තිබුණි.	විදුලි හා ජල ගාස්තු ඉහළ යාම හේතුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් ප්‍රතිපාදන සපයාගන්නා ලදී.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කාර්යාල අවශ්‍යතා මිලදීගැනීමේදී දැඩි පාලනයක් යටතේ සිදුකළ යුතු අතර, වාර්ෂික සත්‍ය අවශ්‍යතාවය මත පමණක් ප්‍රසම්පාදනය කළ යුතු වුවත්, රු.10,000,000ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මාරුකර ගෙන තිබූ අතර, මෙය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 143ක වැඩිවීමකි.	නව ගොඩනැගිල්ලේ මෙහෙයුම් කටයුතු ආරම්භවීමත් සමග ඇති වූ පරිගණක අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා පරිගණක මිලදීගැනීමට වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අඛණ්ඩව සේවා කටයුතු පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව මත මුදල් රෙගුලාසි 66 මඟින් ප්‍රතිපාදන මාරුකර අදාළ අවශ්‍යතාවය සපුරාගන්නා ලදී.	තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළැඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව වාර්තාකරන ආයතනයේ ඇති බැඳීම් හා බැරකම් 2024 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු නමුත්,	විගණන නිරීක්ෂණය පිළිගනිමි. නියමිත කාලසීමාව තුළ බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙසේ සිදු වූ බව කාරුණිකව දන්වා සිටිමි.	යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන පරිදි බැරකම් හෙළිදරව් කළ යුතු ය.

රු.610,039ක වටිනාකමකින් යුත් 2024 වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර ඇති බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ හා **SA** 92 භාණ්ඩාගාර මුද්‍රිතයේ ඇතුළත්කර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

	නිරීක්ෂණය			**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 28.5 හා 28.6 උපවගන්ති	10,669	ඉඩදී ඇති කාලසීමාව ඇතුළත ඉදිරිපත්කර නොමැති ගමන් වියදම් ඉල්ලුම්පත්‍රයකට මුදල් රෙගුලාසි 115ට යටත්ව අඩුකිරීම් සිදුකොට මුදල් ගෙවිය යුතු වුව ද, අවස්ථා 12ක දී ප්‍රමාද ගාස්තු අයනොකර සම්පූර්ණ ගමන් ගාස්තුවම ගෙවා තිබුණි.	ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බවට සටහන්කර ගන්නා අතර, අයනොවූ ප්‍රමාද ගාස්තු නැවත අයකර ගැනීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතු ය.
(ආ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	(i) මු.රෙ. 104(4)	-	අනතුරු සිදු වූ දින සිට මාස 03ක් ඇතුළත දී අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ලබාගත යුතු වුව ද, 2023 හා 2024 වර්ෂවලදී සිදු වූ වාහන අනතුරු 23ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.	අවසන් වාර්තා සකස්කර ගෙන යමින් පවතින බව දන්වමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

(ii)	මු.රෙ.137	576,828	සේවාවන්, වැඩ හෝ සැපයුම් සම්පූර්ණ කෙරුණු විට, ඒ සම්බන්ධයෙන් හිමිකම් භාරගැනීමට බලය දෙනු ලැබ ඇති අනුමත කිරීමේ නිලධාරියා වශයෙන් අනුමැතිය ලබාදී ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු වුවත්, ගෙවීම් වවුචර් 06ක් සඳහා අනුමැතිය ලබාගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණු අතර, සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 137 ඇතුළත් කරුණු සම්බන්ධයෙන් වියදම සහතික කිරීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, වවුචර් 07ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතුකර නොතිබුණි.	විගණන නිරීක්ෂණයෙන් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටින අතර, මින් ඉදිරියේ දී අඩුපාඩු සහිතව ගෙවීම් නොකිරීමට වග බලාගන්නා ලෙස අදාළ අංශ දැනුවත් කරන ලදී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(iii)	මු.රෙ. 165(2) (අ) (i)	115,664,500	මාණ්ඩලික නිලධාරියෙකු විසින් ලැබීම්වල ගණන් ප්‍රමාණය වහාම චෙක්පත්, මුදල් ඇණවුම් යනාදිය පිළිබඳව වූ ලේඛනයෙහි සටහන් කොට සහතික කළ යුතු බව දක්වා තිබුණ ද, මුදල් පොත හා කුවිතාන්සියේ නියැදි පරීක්ෂණය පරිදි 2024 ජූලි 12 දිනෙන් පසුව ලද චෙක්පත් හා මුදල් එම මුදල් ලේඛනයෙහි සටහන්කර නොතිබුණු අතර, එම ලැබීම් ගිණුම්වලට ගෙන තිබුණේ ද යන්න තහවුරුකර ගත නොහැකි විය.	මේ වන විට විගණන නිරීක්ෂණයේ සඳහන් අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතුකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(iv)	මු.රෙ.237 (අ)(i)	4,110,122	කිසියම් ගිවිසුමක් ප්‍රකාරව සිදුකරන වැඩ හෝ සැපයුම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක ලෙස වැඩ නිමකර ඇති බවට, සහතිකයක් මත ගෙවීම් කළ යුතු වුව ද, සේවාවන් හා අලුත්වැඩියා කිරීම් 08කට අදාළව එම කාර්යයට අදාළ වගකිව යුතු නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගැනීමකින් තොරව ගෙවීම්කර තිබුණි.	විගණන විමසුමෙහි සඳහන් සේවාවන් හා අලුත්වැඩියා කිරීම් සිදුකිරීමෙන් සිදු වූ ප්‍රමාද දෝෂයකින් අදාළ සහතිකය මුල් ඉන්වොයිස්පතෙහි සටහන් තැබීම මඟ හැරී ඇති අතර, ඉදිරියේදී එවැනි අතපසුවීම් සිදු නොවන ආකාරයට කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වැඩ නිමකළ බවට සහතිකයක් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.
(v)	මු.රෙ.237 (ආ)	119,449	භාණ්ඩ ලැබී ඇති බවට අදාළ බඩුලේඛනයේ ඇතුළත් කළ බවට සහතිකයක් ඇමිණිය යුතු වුව ද, භාණ්ඩ මිලදීගැනීම් අවස්ථා 04ක් සඳහා එපරිදි කටයුතුකර නොතිබුණි.	විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි භාණ්ඩ ලැබීම් ලේඛනයේ ඇතුළත් කළ බවට සහතිකය ඇමුණූ අතර, මින් ඉදිරියට විගණන නිරීක්ෂණය අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(vi)	මු.රෙ. 1642	-	වාහනවලට සිදුවන සියලුම හදිසි අනතුරු ළඟම පොලිස් ස්ථානයට වාර්තා කළ යුතුව තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයට අදාළව සිදු වූ වාහන අනතුරු 04ක් සම්බන්ධයෙන් පොලීසියට වාර්තාකර නොතිබුණි.	විගණනයෙහි සඳහන් අදාළ අනතුරු සම්බන්ධයෙන් ලොග් පොත් යාවත්කාලීනකර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව අනතුරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.
(ඇ)	**රාජ්‍ය මුදල් චක්‍රලේඛ**				
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020	-	2023 සහ 2024 භාණ්ඩ සමීක්ෂණයේ කාර්යන් සම්බන්ධයෙන් දෙපාර්තුමේන්තුව චක්‍රලේඛය පරිදි අදාළ	විගණනයෙන් සඳහන්කර ඇති පරිදි අදාළ චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස	රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

දරන 11.1 වගන්තියට අනුව මු.රෙ. 756(6)		කර්තව්‍යයන් නියමිත කාලය තුළ සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අදාළ කාලවකවානුව තුළ කටයුතුකර නොතිබුණි.	අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදුනිමි.	
(ii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛයේ මු.රෙ. 371(2) හා 371(5)	709,115	කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා වූ තත්කාර්යය අතුරු අග්‍රිමය නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2024 ජනවාරි 01 සිට ජූනි 30 දක්වා අවස්ථා 40කදී ලබාදී තිබුණු අතුරු අග්‍රිම, දින 19 සිට මාස 04 දක්වා කාලප්‍රමාදයක් සහිතව පියවා තිබුණි.	විගණන විමසුමෙහි සඳහන් අනෙකුත් අතුරු අග්‍රිම නිරවුල් කිරීම දින කිහිපයකින් ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් සිදු නොවීමට වග බලා ගන්නා ලෙස අදාළ නිලධාරින් දැනුවත් කරන ලදී.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු ය.

3.5 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
වර්ෂ 02කට වැඩි රු.28,638,265ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ පැවතුණි.	විගණන නිරීක්ෂණයේ සඳහන් කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	රැඳවුම් මුදල් නිරවුල් කළ යුතු ය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2024 දෙසැම්බර් 31 දිනට උපදෙස් ගොනු සංඛ්‍යාව 25,718ක් පැවති අතර, 2024 වර්ෂය තුළ ඉන් ගොනු 7,698 ක් අවසන්කර තිබූ අතර තවදුරටත් ඉතිරි ගොනු 18,020ක් විය. මේ අනුව 2024 දෙසැම්බර් 31 වන විට සියයට 70ක උපදෙස් ගොනු ප්‍රමාණයක් ඉතිරිව පැවතුණි.	උපදෙස් ගොනු සම්බන්ධයෙන් 2025.03.24 දිනැති වාර්තාව මගින් අප විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2024.01.01 දින සිට 2024.12.31 දක්වා අපරාධ අංශය සහ ළමා අපචාර අංශය යන අංශවලට ලැබී ඇති උපදෙස් ගොනු ප්‍රමාණය එම වර්ෂය තුළම අවසන් කිරීමට කටයුතුකර ඇත. තව ද, දැනට පවතින නඩු/උපදෙස් ගොනු වැඩි ප්‍රතිශතයක් පෙර වර්ෂවලින් ඉදිරියට ගෙන ආ ගොනු වන අතර, එම සංඛ්‍යාව ද මේ වන විට මෙම දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් වාර්තාවේ අන්තර්ගත වී ඇත. මෙයට හේතුව වනුයේ මෙම දෙපාර්තමේන්තුව තුළ පවතින නීති නිලධාරීන්ගේ විශාල පුරප්පාඩු ප්‍රමාණය සහ උපදෙස් අයද සිටින ආයතන යොමුකරන ගොනුවල ඇති අසම්පූර්ණතාවයයි.	උපදෙස් ගොනු කඩිනමින් නිමකිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2024 දෙසැම්බර් 31 වන විට උසාවි නඩුගොනු සංඛ්‍යාව 18,553 ක් වූ අතර 2024 වර්ෂය තුළ ඉන් ගොනු 2,957 ක් අවසන් කර තිබූ අතර, 2024 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ඉතිරි නඩුගොනු සංඛ්‍යාව 15,596 ක් විය. ඒ අනුව ඉතිරි නඩුගොනු සංඛ්‍යාව මුළු උසාවි නඩු ගොනුවලින් සියයට 85 ක ප්‍රතිශතයක් විය.	නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නඩුගොනු අධ්‍යනය කිරීමෙන් අනතුරුව අදාළ පියවර ගැනීමෙන් පසු නඩු පැවරීම සහ නඩු පැවරීම සඳහා උපදෙස් ලබාදීම සිදුකරනු ලබන අතර, ඒවායින් මහාධිකරණ ඉදිරියේ ගොනුකරනු ලබන අධිචෝදනාවලට අදාළ ගොනු අධිකරණයේ නඩු කටයුතු අවසන්වන තුරු නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන්කර වසා දැමීමට හැකියාවක් නොමැති අතර, එකී ගොනු සංඛ්‍යාව ද අප ඉදිරිපත්	නඩුගොනුවල කාර්යයන් කඩිනමින් නිමකිරීමට කටයුතු කළ යුතු ය.

	කළ ඉහත කී වාර්තාවේ අන්තර්ගතව ඇති බව තවදුරටත් දන්වමි.	

4.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය පරිදි සියලුම ගණන්දීමේ නිලධාරින් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත්කර තිබුණේ 2024 පෙබරවාරි 06 දින ය. එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්මේ පිටපත් අදාළ ආයතනය වෙත ද ඉදිරිපත්කර නොතිබුණි.	අදාළ අංශයන්ගෙන් තොරතුරු ලබාගැනීමේදී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් 2024 වර්ෂයට අදාළ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර, ඉදිරියේදී එය නියමිත දිනට සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.	සම්පාදන සැලැස්ම නියමිත දිනට නිමකිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව 1998 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම අඛණ්ඩව වර්ෂ 25ක් එකම පවිත්‍රතා ආයතනයක් වෙතම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර, 2021 නොවැම්බර් 22 දින සිට 2024 දෙසැම්බර් 10 දින දක්වා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් නොමැතිව අදාළ ආයතනය වෙත රු.39,542,785ක මුදලක් පවිත්‍රතා සේවා වෙනුවෙන් ගෙවීම්කර තිබුණි.	2024 දෙසැම්බර් දක්වා කාලයට ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත.	අදාළ ආයතන සමග කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතිව කටයුතු කළ යුතු ය.

(ඇ)	ප්‍රසම්පාදන අත්පොතෙහි 2.11.3 ප්‍රකාරව ප්‍රසම්පාදන ආයතනයක් විසින් ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවන් ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියකට අනුව වාර්තා කළ යුතු මුත්, දෙපාර්තමේන්තුව විසින් ඊට අනුකූලව කටයුතුකර නොතිබුණි.	විගණනයෙහි සඳහන් පරිදි කටයුතු කරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදෙන ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) පරිදි අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගතකර තිබිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව එපරිදි වූ සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.	වසර 03ක් සඳහා වූ අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරි වර්ෂ සඳහා සකස්කරනු ලබන බව දන්වමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඉ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1(අ) පරිදි ලබාගත් ටෙන්ඩර් 6.3.1(ආ) පරිදි ලංසු කැඳවීමේ ලේඛනවල සියලු ලංසු මුද්‍රා තබන ලද කවරයක් යටතේ ඉදිරිපත් කළ යුතු බවට කොන්දේසියක් ඉදිරිපත් වී නොතිබුණු අතර, මුද්‍රා තබන ලද කවරයක් යටතේ ලංසු ඉදිරිපත්කර නොතිබුණි.	මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලබන බව දන්වමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඊ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(ආ) පරිදි ලංසු වැසීමත් සමග හැකිතාක් ඉක්මනින්, ලංසුකරුවන් හෝ පැමිණීමට කැමති ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී ලංසු විවෘතකර ඒ සඳහා අත්සන තැබිය යුතු බව දක්වා තිබුණ ද, ලංසු විවෘත කිරීම පිළිබඳව වාර්තා සටහන් ආකෘතිය තුළ ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයින්ගේ පැමිණ සිටි බවට කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	ලංසු විවර කිරීමේ අවස්ථාව සඳහා අයදුම්කරුවන්ගේ නියෝජිතයන් සහභාගී නොවූ අතර, අදාළ ලංසු විවර කිරීමේ කමිටුව විසින් ලංසු විවරකර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(උ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 පරිදි ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතිපත්‍රයක වාර්තාගත කළ	අදාළ ආයතනය විසින් පිළිගත් මූල්‍ය බැංකුවකින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත්කර තිබෙන අතර, එය ලංසු විවර	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

	යුතු වුවත්, පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනයට අදාළ ලංසු විවෘත කිරීමේ වාර්තාවෙහි මූල්‍යමය තොරතුරු යටතේ ලංසු සුරක්ෂණය තිබෙන බව බැංකුවේ නම හා මුදල ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇතත්, අදාළ ආයතනය ඉදිරිපත්කර තිබූ ලංසු සුරක්ෂණය පිළිබඳ කිසිදු සටහනක් සඳහන්කර නොතිබුණි.	කිරීමේ කමිටුවේ නිරීක්ෂණයට ලක්වී නොමැති අතර, මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කරන බව දන්වමි.	
(ඌ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 පරිදි ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘතිපත්‍රයක වාර්තාගත කළ යුතු වුවත්, වටිනාකම රු.6,893,775ක් වූ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ අවස්ථා 06කදී ලංසු විවෘත කිරීම් ආකෘතිපත්‍ර භාවිතාකර නොතිබුණි.	මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලබන බව දන්වමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(එ)	පරිගණක 50ක් හා UPS යන්ත්‍ර 50ක් මිලදීගැනීම සඳහා වන ඇස්තමේන්තුවක් අනුමතකර නොතිබුණු අතර, 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අන්තර්ගත නොවූ කාර්යයක් වන රු.14,728,482ක වටිනාකමැති පරිගණක උපාංග මිලදීගෙන තිබුණි. තව ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(ආ) ප්‍රකාරව ලංසුවේ වලංගු කාලය ඇතුළත හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රාහක ලිපිය නිකුත්කළ යුතු වුව ද, පරිගණක ප්‍රසම්පාදනයේදී එවැනි ලියවිල්ලක් විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	මින් ඉදිරියට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලබන බව දන්වමි.	අදාළ ඇස්තමේන්තු අනුමතකර තිබිය යුතු අතර, අදාළ මිලදීගැනීම් ප්‍රසම්පාදන සැලැස්මට අනුකූල විය යුතු ය. තව ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	රු.252,000ක් වූ අත්තිකාරම්වලින් සියයට 35කට වඩා වැඩි ප්‍රමාණයක් අදාළ කාර්යයට	ඉදිරියේදී අදාළ තත්කාර්යයට වැයවන මුදල නිවැරදිව තක්සේරු කර අතුරු අග්‍රිම සඳහා ඉල්ලුම්	අවශ්‍යතාවය මත පමණක් අදාළ කාර්යයන්ට අත්තිකාරම් ලබාදිය

	ලබානොගෙන නැවත මුදලින් පියවා තිබුණි.	කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.	යුතු ය.
(ආ)	දෙපාර්තමේන්තුවේ වැඩ තහනමට ලක්වී ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් සහ සේවය හැර ගිය නිලධාරීන් පස්දෙනෙකුගෙන් අයවිය යුතු රු.769,860ක්, වසර 10 – 20ත් අතර කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.	අදාළ හිඟ ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි.	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තුමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 1,295ක් වුව ද, සත්‍ය කාර්යමණ්ඩලය 690ක් වූයෙන් නිලධාරීන් 605ක පුරප්පාඩු පැවතුණි. එය අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 47ක ප්‍රමාණයක් විය.	කාර්යමණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.
(ආ)	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 523ක් පැවතිය ද, 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්යමණ්ඩලය 231ක් වීම හේතුවෙන් නිලධාරී 292ක පුරප්පාඩු පැවතුණි. එය අනුමත කාර්යමණ්ඩලයට සාපේක්ෂව සියයට 56ක අගයක් විය.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා බඳවාගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛනයෙහි ඇතුළත් මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස්කිරීම සඳහා වන මාර්ගෝපදේශයේ 2.12 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා වන වියදම් ඇස්තමේන්තුව සකස්කළ යුතු වුවත්, දෙපාර්තුමේන්තුව විසින් එවැනි වියදම් ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි.	අදාළ වියදම් ඇස්තමේන්තුව සකස්කර ඉදිරිපත් කරන බව දන්වමි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.